





බුලත්සිංහල මෝල්කාව මාර්ගයේ දඹල නාලියද්ද ප්‍රදේශය ගංවතුරෙන් යටවී ඇති අයුරු



පාදුක්ක හංවැල්ල මාර්ගයේ ජලය යටවී ඇති අයුරු.

# මහ වැස්සක් කළු හදියක්

පහළ වායු ගෝලයේ පෙරේදා (10) සිට පවතින කැලඹිලි ස්වභාවය හේතුවෙන් කළුතර, රත්නපුර, කොළඹ, ගම්පහ, කෑගල්ල, ගාල්ල, නුවරඑළිය, කුරුණෑගල, මාතර හා බදුල්ල යන දිස්ත්‍රික්කවලට අධික වර්ෂාවක් ලැබී ඇති අතර, ප්‍රදේශ රැසක් ජලයෙන් යට වී පැවතියේ මේ අයුරිනි.

මේ අතර ඊයේ (11) පස්වරු 6.00 වන විට රත්නපුර ගෙට්ටුකඩේ ප්‍රදේශයට මි.මී 271 ක්ද, කොටහැරට මි.මී 254ක්ද, බුලත්සිංහලට මි.මී 211ක්ද, අලවලට මි.මී 199ක්ද ආදි වශයෙන් දෙල්මෙල්ල, ඉංගිරිය, එල්ලාවල, ගටියමුල්ල, එරත්න, හොරණ, පලාවල,තෙලිගම, පලාබද්දල, සපුමල් කන්ද, පාහියන්ගල, කුරුවිට, ඇහැළියගොඩ, කළුගල, මොරොන්තොට, වරකාපොල, දඹදෙණිය, නෙළුව, මතුගම ප්‍රදේශවලට මිලිමීටර් 100ට වැඩි වර්ෂාපතනයක්ද ලැබී තිබේ.

පවතින අයහපත් කාලගුණ තත්ත්වය හේතුවෙන් කළුතර දිස්ත්‍රික්කයේ ක්ෂණික ජලගැලීම් නිසා පවුල් 144ක 537 දෙනකු අවතැන්ව ඇති බව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහන් කරයි. වැලිපැන්න සුරක්ෂිත මධ්‍යස්ථානයක පවුල් 6ක 24 දෙනකු ඊයේ පස්වරු 6.00 පමණ වන විට රඳවා තිබිණි.

ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය මඟින් දිස්ත්‍රික 9කට නායායෑම් අනතුරු ඇඟවීම් දී තිබේ. කළු, කැලණි, ගිං, නිල්වලා, අත්තනගලු ඔය යන ගංගාවල ස්ථාන ගණනාවකට ගංවතුර අවදානමක් ඇති බව වාරිමාර්ග දෙපාර්තමේන්තුව සඳහන් කරයි. කුකුළේගඟ ජලාශයේ වාන් දොරටු දෙකක් ඊයේ පස්වරුව වන විට විවෘත කර තිබිණි.



ඇල්පිටිය ප්‍රදේශය ජලයෙන් යටවී ඇති අයුරු.







බුලත්කොහුපිටිය යටියන්තොට මාර්ගයේ පුස්සැල්ල ප්‍රදේශයේ වීඔය පිටාර ගලා තිබූ අයුරු.



කැලි කසලවලින් අවහිර වූ හාලිඇල මුගුණුමත පාලම



කුරුණෑගල මීගමුව ප්‍රධාන මාර්ගයේ පල්ලම ප්‍රදේශය ජලයෙන් යටවී ඇති අයුරු.



බේරුවල අබ්දුල් මුවිස් මාවත වතුරෙන් යටවී තිබූ අයුරු



ගම්පහ මිරිස්වත්ත ප්‍රධාන මාර්ගයේ හංසගිරි පාර අසල ජලයෙන් යට වී ඇති අයුරු.



පුස්සැලිඔය පිටාර ගැලීම් නිසා පාදුක්ක මැල්වත්ත ප්‍රදේශයෙ හංවැල්ල පාදුක්ක මහා මාර්ගය ජලයෙන් යටවී තිබූ ආකාර



කැලණිය මල්වාන ප්‍රදේශය ජලයෙන් යටවී






කළුතර වළල්ලාවිට ප්‍රදේශය ජලයෙන් යටවී










ගංවතුරෙන් යටවීම හේතුවෙන් තාවකාලිකව වසා දැමුණු වැලිපැන්න අධිවේගී අන්තර්හුවමාරු පිවිසුම් මාර්ගය

පාදුක්ක සමූහ - රෙක්සි වෙත්තසිංහ, දොඩන්ගොඩ සමූහ - කවිඳු සමරවීර, මතුගම සමූහ - බී.ටී. තඹවිට, කළුතර දිස්ත්‍රික් සංචාරක - සරත් සිරිවර්ධන, බණ්ඩාරගම - බිමල් ජයසිංහ, අඟුරුවාතොට සමූහ - මංගල ප්‍රසන්න, ඇල්පිටිය සමූහ - චන්ද්‍රසිරි ගුණසේකර, අලුත්ගම - තුසිත කුමාරද සිල්වා, කෑගල්ල දිස්ත්‍රික් සමූහ - දයාරත්න බණ්ඩාර සහ යටියන්තොට විශේෂ - සමන් එස්. රත්නායක, ගම්පහ අධිකරණ, හංවැල්ල විශේෂ - අජිත් හේවසිංහ, මීගහකිවුල සමූහ - එන්. නවරත්න, මීගහතැන්න සමූහ, මල්වාන සමූහ - මහානාම විතානගේ, පන්නල - එච්. ඩී. හේවගේ